*KALYĀṆĪ: Journal of the University of Kelaniya, ISSN - 2012-6859, Volume XXXV (Issue I), 2021*

DOI: https://doi.org/10.4038/kalyani.v35i1.57

# A Study of The Native Body Portrayed in the British Colonial Paintings (1800-1900)

S.M.D.G.Suriyabandara
University of Visual and Performing Arts

ABSTRACT

One of the noticeable features of the paintings done by European painters, during the British colonial period is that the native body and the Caucasian body have been designed to bring about two different attitudes. The Caucasians have been painted in the centrepoint with a display of dominance and the native bodies are portrayed as subordinates or as ready to follow the orders of their rulers. This paper tries to shed an insight as to how the European painters of the colonial periods have portrayed the native body and the colonial ideology. British colonial paintings portraying the natives completed during 1800-1900 have been chosen as samples for this study research. Furthermore, the post-colonial theoretical approach has been extensively used in this study. The Post-colonialdiscourse can be identified as a novel approach to study further the aspects missed out and forgotten by the natives of the colonial era. Moreover, the post-structural theoretical approach and semiotics are important to understand the colonial aims and the symbols, seen in the portrayal of the native body in the colonial paintings. Some apparent factors such as localisation, and background composition are taken into consideration. The study reveals that most of the paintings of the native body has been constructed based on euro- centrism. Highlighting the nudity of the native body, and portraying their powerlessness and role as a service provider to the other are important factors. Hence, the study reveals that the colonial British paintings of the native body have been portrayed on the basis of favouritism.

Key Words
British Colonial Era, Colonial Paintings, Euro-centrism, Orientalism, The Other

# බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම්වල නිරූපිත ස්වදේශික රූපය පිළිබඳව අධ්‍යයනයක් (ක්‍රි.ව 1800-1900)


## සංක්ෂේපය

බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ දී යුරෝපීය සිත්තරුන් නිර්මාණය කළ චිත්‍රවල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඔවුන් ස්වදේශික දේහය සහ යුරෝපීය දේහය එකිනෙකට වෙනස් වූ ආකල්ප දෙකකින් ප්‍රතිනිර්මාණය කර තිබීමයි. මෙහි දී යුරෝපීයයන්ගේ කොකේසියානු සිරුර අධිපතිභාවයෙන් යුක්තව වඩාත් බලවත්, කේන්ද්‍රීය ස්ථානයේ රඳවා තිබෙන අතර ස්වදේශිකයා යුරෝපීයයාට යටත් හෝ යුරෝපීයයාගේ නියමයන් පිළිගැනීමට සූදානම් වූ ස්වරූපයෙන් දක්වා තිබේ. යට කී තත්ත්වය විෂය කර ගත් මෙම අධ්‍යයනයෙන් සාකච්ඡා කෙරෙන මූලික ගැටලුව වනුයේ යටත්විජිත යුරෝපීය සිත්තරුන් ස්වදේශික රූපය දෘශ්‍යමය වශයෙන් ගොඩනගා ඇත්තේ කෙසේද සහ එයින් හැඟවෙන යටත්විජිත මතවාද මොනවාද යන්නයි.

මෙම අධ්‍යයනයට තෝරා ගැනෙනුයේ ක්‍රි.ව 1800-1900 අතර කාල පරිච්ඡේදය තුළ නිමවුණු ස්වදේශික රූපය නිරූපිත බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම් ය. එම කාල සීමාවට අදාළ ව තෝරාගත් සිතුවම් නියැඳියක් ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කරන ලදි. අධ්‍යයනයට යටත් දෘශ්‍යමය කියැවීම් සඳහා මූලිකව ම භාවිත වූයේ පශ්චාද් යටත්විජිතවාදී න්‍යායාත්මක ප්‍රවේශයයි. වර්තමානයේ ප්‍රබල විචාරාත්මක ප්‍රවේශයක්වන පශ්චාද් යටත්විජිතවාදී කතිකාව යටත්විජිත වැසියාගෙන් මඟහැරී ගිය විවිධ පැතිකඩ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා නව දැනුම්වේදයක් වශයෙන් හඳුනාගත හැකි ය. එමෙන් ම යටත්විජිත සිතුවම් තුළ ස්වදේශික රූපයේ හැසිරවීම ඔස්සේ පිළිබිඹුවන යටත්විජිතවාදී අභිමථාර්ථ හා සංකේතාර්ථ අවබෝධ කර ගැනීම සඳහා සංඥාර්ථවේදී හා පශ්චාද් ව්‍යුහවාදී න්‍යායාත්මක ප්‍රවේශ ද වැදගත් විය. එහි දී සිතුවම් තුළ ස්වදේශික ශරීරයේ ස්ථානගත වීම, ඉරියව් නිරූපණය,

පසුබිම් සංරචනය යනාදී දෘශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳව ද අවධානය යොමු කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵල අනුව, බහුතරයක් සිතුවම් තුළ ස්වදේශිකයන්ගේ දෘශ්‍ය රූපය යුරෝ-කේන්ද්‍රීය මතවාදයට අනුව ගොඩනංවා ඇති බව නිරීක්ෂණය විය. එහි දී ස්වදේශිකයාගේ නග්නත්වය ඉස්මතු කරමින්, අකර්මණ්‍ය ස්වරූපයෙන් හා බලය රහිත අයෙකු ලෙස දැක්වීම හා යුරෝපීයයා වෙනුවෙන් සේවය සපයන්නෙකු වශයෙන් දැක්වීම ආදිය වැදගත් වේ. මේ අනුව බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම්වල නිරූපිත ස්වදේශික දේහය යටත්විජිත රුචිකත්වයට අනුව ස්වකීය ආස්ථානය මත සැලසුම්කරණය වූ බව නිගමනය විය.

**ප්‍රමුඛ පද**

බ්‍රිතාන්‍ය යටත්විජිත යුගය, යටත්විජිත සිතුවම්, යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය, අනෙකා, පෙරදිගවාදය

**හැඳින්වීම**

ස්වදේශිකයා අරමුණු කර ගත් සිතුවම් ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ සමාජ දේශපාලනික පසුබිම, කතිකාවත් සහ අධිපති මතවාද අධ්‍යයනයේ දී ඉතා වැදගත් දෘශ්‍ය මූලාශ්‍රයකි. මේවායෙහි එකල ලංකාවේ ජීවත් වූ සිංහලයින් ඇතුළු විවිධ ස්වදේශික ජන කණ්ඩායම් පිළිබඳව සැලකිය යුතු දෘශ්‍යමය දත්ත ප්‍රමාණයක් අන්තර්ගත වේ. මෙම දෘශ්‍ය ආකෘති ආශ්‍රයෙන් යටත්විජිතවාදීන් විසින් යටත්වැසියන් පිළිබඳව ප්‍රතිරූප ගොඩනගන ලද්දේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීමටත් ස්වදේශික ශරීර ස්වාභාවය, ඇඳුම් විලාසිතා, ආභරණ, වාර්ගිකත්වය, සමාජ පංතීන් හා රැකීරක්ෂා ආදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අධ්‍යයනය කිරීමටත් ප්‍රවේශයක් සපයයි. එබැවින් මෙම පර්යේෂණ විෂයෙහි ලා විධිමත් දෘශ්‍යමය කියැවීමක් සිදු කිරීමේ අධ්‍යයන අවශ්‍යතාවයක් හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණයේ කේන්ද්‍රීය අවධානය යොමු වන්නේ ක්‍රි.ව 1800 සිට 1900 දක්වා කාලය තුළ නිර්මිත ශ්‍රී ලාංකේය යටත්විජිත සිතුවම්වල ස්වදේශික දේහය නිරූපණය වූයේ කෙසේ ද සහ එම නිරූපණයන්ගෙන් මතුවන යටත්විජිත කතිකාවත් හා එයින් ඇඟවෙන යටත්විජිත කාරක බල පද්ධතීන් කවරේ ද යන්න

අධ්‍යයනය කිරීමයි.

බ්‍රිතාන්‍ය යටත්විජිත සිත්තරුන් විසින් අඳින ලද සිතුවම්වල දක්නට ලැබෙන කැපීපෙනෙන ලක්ෂණයක් වන්නේ ස්වදේශිකයන් ක්‍රියාශීලීත්වයෙන් තොර අභිනයන් සමඟ නිරූපණය කර තිබීමයි. විදේශික සිරුරු හා සාපේක්ෂව සැලකීමේ දී ප්‍රමාණයෙන් ඉතා කුඩා, දුර්වල හා කාලවර්ණ ස්වදේශික සිරුරු සිතුවම් තුළ ප්‍රමුඛත්වයට පත් නො කිරීම සුවිශේෂී ය. ස්වදේශික දේහයට සාපේක්ෂව විදේශිකයන්ගේ නිරූපණ ආධිපත්‍යධාරී ලෙස ස්වදේශිකයාට අණදෙන හෝ ස්වදේශිකයන් පාලනය කරවන ඉදිරිගාමී, ක්‍රියාශීලී හා ප්‍රාණපූර්ණ ස්වභාවයෙන් ස්ථානගත කර ඇති බව නිරීක්ෂණය විය. ස්වදේශික දේහය ප්‍රමුඛව ගොඩනඟන ලද සිතුවම්වල පවා ඇත්තේ ස්වදේශිකයන්ගේ නො දියුණු බව, යුරෝපීයයාගෙන් වෙනස්, අශිෂ්ට වූ, මිත්‍යා ඇදහිලි හා ගුළු විශ්වාස සහිත අයවලුන් වශයෙනි. බ්‍රිතාන්‍ය යටත්විජිත සිත්තරුන්වන Eugene De Ransonnet (1867), L.T. William Lyttleton (1819), John Deschamps (1845), Alexei Dmithrievich (1848), Friedrich Wilhelm Waldemar (1853), Emanuel Andrasy (1853) යන ශිල්පීන්ගේ තෝරාගත් සිතුවම් නියැඳියක් මෙම අධ්‍යයනය සඳහා භාවිතා විය. ශිෂ්ට සම්පන්න යුරෝපීයයා සතු හැකියාවන් සහ ශක්‍යතා යටත්විජිත වැසියා සතු නොවන අතර ඔවුන් ශිෂ්ට කරවීමේ බලය ඇත්තේ තමා සතුව බව මෙම දෘශ්‍ය නියැඳීන් ඇසුරින් ව්‍යංගවත් කිරීම යටත්විජිතවාදී ප්‍රයත්නය වී ද යන්න මෙහි දී පරීක්ෂාවට ලක් විය. ස්වදේශික දේහයේ ස්ථානගත වීම, ඇඳුම්-පැළඳුම් භාවිතය, ඉරියව් නිරූපණය පිළිබඳව අවධානය යොමු කරමින් යට කී පරස්පරතා අධ්‍යයනය කරන ලදි. 19 වැනි සියවසේ නිර්මිත යටත්විජිත සිතුවම් සැළසුම්කරණයේ දී මෙම සුවිශේෂතා අන්තර්ගත කිරීම ඔස්සේ තත්කාලීන අධිපති මතවාද, දැනුම් පද්ධති සහ සංකතන එකල පැවති සමාජ දේශපාලනික ගතිකයන්ට සාපේක්ෂව අවබෝධ කර ගැනීම මෙම පඨිතයේ මූලික අරමුණයි.

**න්‍යායාත්මක සන්දර්භය**

මෙම ලිපියේ මූලික උපකල්පනය වනුයේ බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේ නිර්මිත සිතුවම් එම දෘශ්‍ය කලා ව්‍යාපෘති නිර්මාණය වූ අවස්ථාවේ අධිපතීත්වය දරන දැනුම් පද්ධති, ප්‍රවාද සහ මතවාද සමඟ සම්බන්ධව ගොඩනැගුණු සමාජ දේශපාලනික අවශ්‍යතාවන්ගේ නියෝජනයක් බව තහවුරු කිරීමයි. එනම් යටත්විජිත සිත්තරා ස්වදේශික රූපය ප්‍රතිනිර්මාණය කර ඇත්තේ ඔහු නිර්මාණ ක්‍රියාවලියෙහි නිමග්නව සිටි අවස්ථාවේ අධිපතීත්වය දරන ලද දැනුමට අනුරූපීව බවයි. මෙම යටත්විජිත සිතුවම් අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි ඉතා වැදගත් ලක්ෂණයක් වන්නේ ස්වදේශික රූපයේ අපරූපීකරණයයි.

'ශ්‍රී ලාංකේය යටත්විජිත යුගය' මෙම පර්යේෂණයේ ප්‍රධාන අධ්‍යයන වපසරිය වශයෙන් හඳුනා ගැනේ. අධ්‍යයනයට යටත් දෘශ්‍යමය කියැවීම් සඳහා මූලිකව ම භාවිතා කෙරෙනුයේ යටත්විජිතවාදී හා පශ්චාද් යටත්විජිතවාදී න්‍යායාත්මක ප්‍රවේශයන් ය. ස්වදේශිකයා හා ස්වදේශික භූමිය නිරූපණය පිළිබඳව පශ්චාද් යටත්විජිතවාදී මතවාදය වර්තමාන කියවීම් තුළ ප්‍රබල අධිපති මතවාදයක් වශයෙන් හඳුනාගත හැකි ය. එබැවින් මෙම න්‍යායාත්මක පසුබිම යටත්විජිත වැසියාගෙන් මඟහැරී ගිය විවිධ පැතිකඩ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා නව ප්‍රවේශ සපයයි. පශ්චාද් යටත්විජිතවාදී විචාරකයින් මෙම න්‍යායාත්මක ප්‍රවේශය යටතේ පරීක්ෂා කරනුයේ යටත්විජිත කාරකයා යටත්විජිත සමාජය දෙස බැලූ ආකාරය හා අර්ථකතනය කළ ආකාරයේ විකෘතිතාවන් ය. එමගින් අනෙකාගේ සංස්කෘතික අනන්‍යතා විකෘති වී ඇති ස්වරූපයත්, යුරෝපීයයන් යටත්විජිත භූමිය තුළ ඉතා කෙටි කාල සීමාවක් වාසය කර එයින් ලැබූ අත්දැකීම්වලින් සමස්තය පිළිබඳව එළඹී ඇති විකාර සහගත නිගමන පිළිබඳවත් පරීක්ෂාවට ලක් කරයි. රොබට් යොන්ග් සහ ස්ටෙපන් ලෙමොන්ට අනුව පශ්චාද් යටත්විජිතවාදීන් පෙන්වාදෙන පරිදි යටත්විජිතකරණය වනාහී හුදු දේශපාලනිකමය ක්‍රියාවලියක් හරහා භූමිය අත්පත් කර ගැනීමක් පමණක් නොව, මතවාදීමය වශයෙන් ද යටත්විජිත වැසියා කෙරෙහි අධිපතීත්වය පැවැත්වීමකි (උපුටා ගැනීම ජයතිලක

2017: 284). මෙය යුරෝ-කේන්ද්‍රීයවාදයේ එක් මුහුණුවරකි.

යුරෝ-කේන්ද්‍රීයවාදයේ මූලික තර්කය වූයේ යටත්විජිත කාරකයා වඩාත් උසස් ශිෂ්ට සම්පන්න දියුණු සහ බලය සහිත පාර්ශවයේ නියෝජනයක් බවත්, යටත්විජිත වැසියා එහි ප්‍රතිපක්ෂයේ නියෝජනයක්වන බවත් ය. යුරෝ-කේන්ද්‍රීයවාදය හරහා යුරෝපීයයා හා ඔහුගේ දැනුම්වේදය සුජාතභාවයට පැමිණෙයි. යුරෝපීයයන් යටත්විජිතවාදය හරහා සමාජගත කිරීමට උත්සුක වූයේ ස්වකීය අධිපතිභාවයයි. යටත්විජිතකරණය තුළින් නිර්මාණය කරන ලද මතවාදීමය පසුබිම හා එහි ක්‍රියාකාරකම් විශ්ලේෂණය කරමින් එහි ඒකපාර්ශවීය තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීම පශ්චාද් යටත්විජිතවාදය හරහා සිදු විය. එබැවින් ස්වදේශිකයා විෂය කරගත් යටත්විජිත සිතුවම් තුළින් යුරෝපීයයන් සමාජගත කිරීමට උත්සුක වූ මතවාදීමය ප්‍රවේශය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පූර්වෝක්ත න්‍යායාත්මක එළඹුම වැදගත් වේ. එහි දී එඩ්වඩ් සයීද්ගේ *Orientalism (2003)* නැමති කෘතිය ඔස්සේ පශ්චාද් යටත්විජිතවාදී කියවීම්වලට අදාළ වූ පෙරදිගවාදී සංකල්පය පිළිබඳවත්, පාතාර් චැටර්ජි, රංජිත් ගුහා, ගයාත් පාන්ඩේ, සයිඩ් අමින් ආදී න්‍යායාචාර්ය වරුන් සංකල්පගත කරන ලද නිර්ප්‍රභූ අධ්‍යයනය (*Subaltern Studies*) හා 'අනෙකා' (*The Other*) නැමති සංකල්ප පිළිබඳවත් මෙම පර්යේෂණයේ දී පූර්ණ අවධානය යොමු විය. පෙරදිගවාදය යනු, බටහිර වැසියා පෙරදිග පිළිබඳව ඥානනය කරනු ලැබූ පිළිවෙළකි. එනම් බටහිර දෘෂ්ටිකෝණයට අනුව පෙරදිග වැසියා මානගත කිරීමයි. පෙරදිගවාදය නමැති සංකල්පයට විකල්පයක් වශයෙන් පශ්චාද් යටත්විජිත කතිකාව තුළ නිර්ප්‍රභූ අධ්‍යයනය භාවිතයට පැමිණේ. එහි දී සුවිශේෂී අවධානයක් යොමු වන්නේ පන්තිය, ජනවර්ගය, කුලය, ලිංගිකත්වය යන ඕනෑම කරුණක් තුළ ආසියානු ජන සමාජවල පවතින සමාජ ධූරාවලියේ වඩා පහත් ස්ථානවල ඓතිහාසිකව ස්ථානගත වූ සමාජ කණ්ඩායම් පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

ඉහත සඳහන් කළ න්‍යායාත්මක පදනමේ පිහිටා මෙම ලිපියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂා කෙරෙන ප්‍රධාන ගැටලු ද්විත්වයකි. ඉන්

පළමු වැන්න යටත්විජිත යුරෝපීය සිත්තරුන් විසින් ස්වදේශික රූපය දෘශ්‍යමය වශයෙන් ගොඩනගා ඇත්තේ කෙසේද යන්න විමසීමයි. දෙවැන්න එකී නිරූපණයන්ගෙන් හැඟවෙන යටත්විජිත මතවාද මොනවාද යන්න හඳුනා ගැනීමයි. මෙම ප්‍රධාන ගැටලු ද්විත්වය ඇසුරෙන් 19 වැනි සියවසේ සිතුවම් තුළ ස්වදේශික රූපයේ හැසිරීම යුරෝ-කේන්ද්‍රීය කතිකාවත්, දැනුම් පද්ධති සහ යුරෝපීය රුචිකත්වයට සාපේක්‍ෂව විමසා බැලීම මෙම ලිපියෙන් අරමුණු කෙරේ.

**යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය හා අනෙකා**

අනෙකා (The Other) යනු, විජිතවාදීන් විසින් යටත්විජිත වැසියා හැඳින්වීම සඳහා භාවිතා කරනු ලබන විශේෂණ පදයකි. යටත් යන්නෙන් අවනත වූ, කීකරු වූ, සුවච වූ, යමෙකුගේ බලය පිළිගත්තා වූ යන අදහස් ගම්‍යවන අතර යටත් වැසියා යන්නෙන් කිසියම් රාජ්‍යයකට අවනතභාවය ප්‍රකාශ කළ, යටත්ව ජීවත්වන්නා යන අදහස මුක්ත වේ (සංස්කෘතික දෙපාර්තමේන්තුව 1990: 25). මෙම අනෙකා ගොඩනැගීම තුළ ඇත්තේ ද්විත්ව ප්‍රතිපක්‍ෂය (Binary Opposition) පිළිබඳ අදහසකි (පතිරගේ 2005: 86- 87). ද්විත්ව ප්‍රතිපක්‍ෂය යනු, ලෝකය දෙකට කඩා විග්‍රහ කිරීමේ පිළිවෙතයි. නිදසුන් ලෙස කළු-සුදු, හොඳ-නරක, විදග්ධ-මුග්ධ, ස්ත්‍රී-පුරුෂ, උස්-පහත් ආදී වශයෙනි. යුරෝපීයයා තම ස්ථානය කේන්ද්‍රය ලෙසත්, යුරෝපයට පරිබාහිර අනෙකුත් සමාජ පරිවාරය ලෙසත් ආකෘතිගත කරයි. මෙම කේන්ද්‍රය හා පරිවාරය අතර වෙනස පදනම් වන්නේ ඔවුන්ගේ ශිෂ්ටත්වය පිළිබඳ විග්‍රහය මත වීම වැදගත් ය. ඒ අනුව සැලකීමේ දී කේන්ද්‍රය ශිෂ්ටවන අතර පරිවාරය අශිෂ්ට වේ. එනම්, යටත්විජිත කාරකයා ශිෂ්ටවන අතර අනෙකා අශිෂ්ට වේ. කේන්ද්‍රය බුද්ධිමත් හා තාර්කිකවන අතර, පරිවාරය, මුග්ධ හා හැඟීම් බර වේ. මෙහි දී යුරෝපීයයා නිරන්තරයෙන් ම විශිෂ්ටත්වයට පත්වන අතර පරිවාරය විශිෂ්ටත්වය යදින්නෝ වෙති (පතිරගේ 2005: 87). යටත්විජිතවාදීන් විසින් පරිවාරය සූරාකෑම පිණිස තමන්ට ඇති අයිතිය සාධාරණීකරණය කරනු ලැබූවේ මෙම ද්විත්ව ප්‍රතිපක්‍ෂය මත පදනම් වෙමිනි. මෙම මතයට අනුව පරිවාරයේ සිටින අශිෂ්ටයන් ශිෂ්ට කළ හැක්කේත් ඔවුන්ගේ අඥානවන්ත

ස්වභාවය දුරු කළ හැක්කේත් කේන්ද්‍රයට පමණි. මේ අනුව, කේන්ද්‍රය අනිවාර්යයෙන් ම උසස් බවට පැමිණේ. තවද මෙම මතවාදය මඟින් 'අනෙකා' වහල් භාවයට පමුණුවන අතර ශ්‍රම සූරා කෑම හා යටත්විජිත රටවල සම්පත් කොල්ලකෑම සිදු කෙරේ. එබැවින් මෙය අතිශය ම්ලේච්ඡ පිළිවෙතක් වශයෙන් හඳුනාගත හැකි ය. මෙකී සන්ධර්භයන් සුජාත භාවයට පත් කිරීමේ මතවාදීමය ප්‍රවිශ්ටය යටත්විජිතවාදය වශයෙන් හැඳින්වේ. ඒ අනුව "අනෙකා" නැමති සංකල්පය ඇසුරින් යටත් වැසියා හැඳින්වීමේ ප්‍රවේශය ලැබෙනුයේ ඉහත කී යටත්විජිතවාදී මතවාදයේ ප්‍රතිඵලයක් වශයෙනි.

යටත්විජිත කතිකාව තුළ යටත්විජිත කාරකයා සහ යටත්විජිත වැසියා අතර තිබූ සම්බන්ධතාවත් යටත්විජිත තුළ විසූ ප්‍රජාව විජිතවාදීන් දුටු ආකාරයත් පිළිබඳව අවබෝධය මෙහි ලා වැදගත් වේ. යටත්විජිතවාදීන් විසින් විජිතවාසී ප්‍රජාව දුටු ආකාරය යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ ඔවුන් මෙම ජන සමාජවල ජනයාව තේරුම්ගත් සහ ඔවුන්ව විග්‍රහ කළ ආකාරයයි. යටත්විජිතවාදීන් වෙනුවෙන් මුල් කාලීනව යටත්විජිත වැසියන් පිළිබඳව විස්තර විග්‍රහ ඉදිරිපත් කිරීමේ කාර්යභාරය ඉටුකරන ලද්දේ මෙම රටවල් තුළ සංචාරය කළ මිශනාරීන්, වෙළෙන්ඳන්, මුහුදු කොල්ලකරුවන්, හමුදා නිලධාරීන් වැනි අය විසින් සටහන් කරන ලද, උත්කර්ෂයට නංවන ලද දින සටහන් සහ අනෙකුත් සංචාරක වාර්තා මඟිනි. ඉන් පසුව මෙම කාර්යභාරය යටත් ප්‍රදේශ පාලනය කිරීමට පැමිණි සිවිල් නිලධාරීන් සහ අනෙකුත් විජිතවාදී බුද්ධිමතුන් අතින් සිදු විය. මෙම කුමන පාර්ශවයක් පිළිබඳව සලකා බැලුව ද ඔවුන් මෙම යටත් වැසියන් දෙස බලන ලද්දේ පටු, ආන්තිකවාදී දෘෂ්ටි කෝණයකිනි. එම දෘෂ්ටි කෝණය 'යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය' වශයෙන් හැඳින්වේ. එනම්, යුරෝපීය ආකල්ප හා සංස්කෘතික දෘෂ්ටි මුල් කොට ගනිමින් ලෝකයේ අනෙක් කලාප දෙස බැලීම සහ ඒවා ඇගයුම් කිරීමේ පිළිවෙතයි (පතිරගේ 2005: 114). ඒ අනුව යටත්විජිත කාරකයා වඩාත් බලවත්, ශිෂ්ට සම්පන්න, දියුණු, ඉදිරිගාමී දක්මක් සහිත පුද්ගලයන් ලෙස අර්ථ ගැන්වුණු අතර යටත්විජිත වැසියාට එහි ප්‍රතිපක්ෂය හිමි විය. එනම්,

අශිෂ්ට, ම්ලේච්ඡ, වනචාරී, නො දියුණු, පසුගාමී ජන කණ්ඩායමක් වශයෙනි. ඒ අනුව, මෙම දෘෂ්ටිවාදය මගින් තහවුරු කරන ලද්දේ තම විජිතවාදී ආකල්පය සාධාරණීකරණය කිරීමේ අවශ්‍යතාවයයි. එනම්, මෙම ප්‍රජාව ශිෂ්ට සම්පන්න, බුද්ධිමත්, තාර්කික ප්‍රජාවක් කිරීමේ හැකියාව ඇත්තේ තමන්ට බව පැවසීම ය. මෙම පටු වර්ගවාදී දෘෂ්ටිය මගින් යටත්විජිත හාම්පුතුන්ගේ විශිෂ්ටත්වයත් යටත්වැසියාගේ පහත් බවත් තහවුරු කරන ලදි. යුරෝ කේන්ද්‍රීය දැනුම වනාහි යුරෝපීයයන් විසින් යටත්විජිතවාසීන් ස්වකීය යටත්විජිතකරණ ක්‍රියාවලියට නතු කර තැබීම සඳහා නිෂ්පාදනය කරන ලද අධිකාරිත්වයක් ලෙස ද හඳුනාගත හැකි ය (ජයතිලක 2017: 284). යුරෝ-කේන්ද්‍රීයවාදය හරහා ගොඩ ගොඩනැගුණු මෙම මතවාදී අධිපති භාවය යටත්විජිත පාලන තන්ත්‍රය පවත්වා ගැනීම විෂයෙහි වැදගත් අවශ්‍යතාවයක් විය.

> "සිංහලයා ස්වාභාවයෙන් ම කම්මැලි ජාතියකි. යන්තම් ඔහේ උපන්නාට වැනෙනවා විනා වැඩ කිරීමට නම් ඔවුහු එතරම් රුචියක් නො දක්වති. ඔවුහු විලි වසාගන්නට වස්ත්‍රත්, කන්නට බොන්නට ආහාර-පානත් අඳුරේ සිටින්නට බැරි නිසා පහන් දල්වා ගන්නට තෙලුත් සපයා ගනිති. ඒ ඔවුන් හට හොඳටම ප්‍රමාණවත් ය" (නොක්ස් 1998: 122).

රොබට් නොක්ස්ගේ එදා හෙළදිව කෘතියෙන් උපුටාගත් පූර්වෝක්ත උදෘතයෙන් විස්තර කෙරෙනුයේ තත්කාලීන සිංහලයාගේ ජීවන ස්වාභාවයයි. නොක්ස්ට අනුව සිංහලයා යනු කම්මැලි, පසුගාමී සත්ත්ව කොට්ඨාශයකි. සිංහලයින් දෛනික පැවැත්මට අත්‍යවශ්‍ය මූලික කරුණු ඉටු කර ගැනීමට පමණක් උත්සාහ දරණ බව වැඩි දුරටත් ඔහු අවධාරණයට ලක් කරයි.

> "සාමාන්‍ය මිනිසුන්ගේ අදහස් ඕපපාතික සිදුවීම්වලින් ඔබ්බට නොයයි. ඔවුන් අතීතය පිළිබඳව නො සිතනවා මෙන් ම අනාගතය පිළිබඳව ඇත්තේ ද අපරීක්ෂාකාරී හැඟීමකි. ඔවුන්ගේ ජීවිත පහසු මැලිකමක් මත පදනම් වී ඇති අතර සත්ව ජීවිතයට වඩා උසස් වන්නේ මඳ වශයෙනි" (ජේම්ස් කෝර්ඩිනර්- උපුටා ගැනීම පෙරේරා 2017: 379).

> "ජීවිතය මුළුල්ලේ ම මන්දගාමී ලෙස බඩගාගෙන යන පණුවාගේ එකම අභිප්‍රාය වන්නේ උගේ ආහාර පරිභෝජනය කිරීම සඳහා පැගී මියයාමෙන් වැළකී සිටීමයි. එම පණුවා කෙට්ටු කම්මැළි සහ ක්‍රියාශීලීත්වයෙන් තොර ලාංකිකයා තරම්ම උතුම් වූවෙකි. ඔහුගේ සහචරයන්වන අලියා ගම් ඌරා යන සත්තු ඔවුන්ට වඩා බෙහෙවින් ඉදිරිගාමී වෙත්" (එඩ්වර්ඩ් සලිවන්ස්- උපුටා ගැනීම පතිරගේ 2005: 86).

ඉහත කෙටියෙන් සම්පිණ්ඩනය කළ අධිරාජ්‍යවාදී ආකල්ප සමස්ථයක් ලෙස ගත් කළ ස්වදේශිකයා පිළිබඳ අදහස් දැක්වීමේ දී බොහෝ විට නිෂේධනීය වාග් මාලාවක් භාවිතා වී ඇති බව නිරීක්ෂණය කළ හැකි ය. කෝඩිනර් සහ සලිවන්ස්ගේ පූර්වෝක්ත උදෘත මඟින් ස්වදේශිකයන්ගේ චර්යා හාස්‍යයට නංවා තිබේ. ශ්‍රී ලාංකිකයින්ගේ ශරීර ස්වභාවය කෙට්ටු පණුවෙකුට සමාන කර දක්වන සලිවන්ස් ස්වදේශිකයාගේ ක්‍රියාශීලීත්වයෙන් තොර බව "උතුම්" යන පදය භාවිතයෙන් හාස්‍යයට නංවා තිබේ. ඔවුන්ට අනුව මනුෂ්‍ය ජීවිතය අතිශය කාර්ය බහුල විය යුතු ය. අනාගතය පිළිබඳව උපකල්පනය කොට ආරක්ෂණය උදෙසා බව බෝග රැස් කළ යුතු ය. කෝඩිනර් වැන්නවුන් වටහා නොගත් යථාර්තය නම්, කිසියම් ප්‍රජාවකගේ ලෝක දෘෂ්ටිය පූර්වයේ සඳහන් කළ පරිදි එම ප්‍රජාවගේ ආර්ථික, ආගමික හා සාමාජිය පැවැත්ම සමඟ බද්දව පවතින්නක් බවයි. මේ අනුව පැහැදිලිවන ප්‍රධානතම කරුණක් නම් සෑම විටක ම යටත්විජිත කාරකයා ස්වකීය සංස්කෘතික මිනුම් දඬු ඇසුරින් " අනෙකා" සාධනය කර ඇති බවත් එමඟින් අනෙකා සමාජ ආන්තීකරණයට ලක්කර ඇති බවත් ය. විජිතවාදීන්ගේ මෙම මතවාදීමය පසුබිම යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය වශයෙන් හඳුනාගත හැකි ය. යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය අනුව යටත්විජිත වශයෙන් පවතින නො දියුණු රටවල් ප්‍රගමනය සඳහා තල්ලු කළ යුතු ය. යටත්විජිත බවට පත් වූ රටවල් වෙත පැමිණි හාම්පුතුන් හා මිෂනාරීන් සිදු කළ ප්‍රකාශයක්වන "අප පැමිණියේ නුඹලා ශිෂ්ට කිරීමටයි" යන්නෙන් අර්ථවත් වන්නේ එයයි. යටත්විජිතකරණයේ ප්‍රතිඵලයක් වූ මිෂනාරි අධ්‍යාපනය, බාලදක්ෂ ව්‍යාපාර ප්‍රචලිත කරවීම, 'අනෙකා' ශිෂ්ට කිරීමේ යුරෝපීය

උත්සාහයන්ගේ ප්‍රතිඵල වශයෙන් පෙන්වාදිය හැකි ය (සිල්වා 2005: 169). යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිය තුළ අනෙකා පිළිබඳව යුරෝපීයයන්ගේ ආකල්පය එසේ වුව ද ස්වකීයයන් පිළිබඳව විජිතවාදීහු අර්ථකතන ගොඩනඟා ඇත්තේ එයින් ප්‍රතිපක්ෂ ආකෘතියකිනි. රොබට් නොක්ස්ට අනුව, ස්වදේශික ජනයා විදේශිකයන් පිළිබඳ දැරූ ආකල්ප පහත පරිදි වේ.

> "උදෑසන ගමනක් යාම ඇරඹීමේ දී ඔවුහු පෙරමඟ ලකුණු පිළිබඳව දැඩි සංවේදී බවක් පෙන්වති. සුද්දකු හෝ විසල් උදරයක් ඇති කාන්තාවක හෝ දැකීම සුබ පෙර නිමිත්තක් මෙන් ඒ අය සලකත්" (නොක්ස් 1998: 113).

විදේශිකයන් වනාහී සුභ සංකේතයක් වශයෙන් හඳුන්වා ගනිමින් ස්වකීයයන් පිළිබඳ සුදු ප්‍රතිරූපක ගොඩනැංවීමට ගත් උත්සාහයක් ඉහත දී නිරීක්ෂණය වේ. මෙම විග්‍රහය තුළ අත්තුක්කංසනවාදී සහ පරවම්භනවාදී පිළිවෙතක් අන්තර්ගත වේ (පතිරගේ 2005: 87). එනම්, සෑම තැනකදීම 'මා' ශ්‍රේෂ්ඨවන අතර, 'අනෙකා' තමාට වඩා පහත් තැනක ස්ථානගත කිරීමයි. මෙය ධූරාවලිගත කිරීමකි. පූර්වෝක්ත උපුටනයේ වාච්‍යාර්ථය විදේශිකයෙකු පෙරමඟට හමුවීම සුභ සංකේතයක්වන බවයි. නමුත් එයින් ව්‍යංගවත්වන කරුණක් නම්, කළු හම සහිත ස්වදේශිකයන් වනාහී අසුභ සහ අප්‍රසන්න සංකේතයක් ය යන්නයි. යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටියට අනුව ස්වදේශිකයා අලස, ඉතා කම්මැලි හා කෘශ වූවෙක් ලෙස පෙන්වාදෙන යටත්විජිත කාරකයින් ස්වකීයයා පිළිබඳ උසස් ආකල්ප මත පිහිටා ක්‍රියා කර ඇති අයුරු මෙහි දී පැහැදිලි වේ. මෙම ද්විත්වතා බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම් ඇසුරින් වඩාත් විස්තරාත්මකව සාධනය කළ හැකි වේ.


යටත්විජිත සිතුවම් සඳහා ප්‍රධාන වශයෙන් වස්තුවිෂය වූයේ ස්වදේශික භූමිය සහ ස්වදේශිකයන් ආශ්‍රිත විවිධ සිදුවීම් ය. මෙම වාර්තා සහ සිතුවම් ඇඳීමේ මූලික අභිප්‍රාය වූයේ තමන් කරන කියන දෑ බ්‍රිතාන්‍යය දේශ වාසීන්ට දැනගන්නට සැලැස්වීමයි (ධර්මසිරි 1990: 129); එමෙන් ම යටත්විජිත සමාජයේ ජන ජීවිතය හා එහි අරුම පුදුම පැවැත්ම අධිරාජ්‍යයට වාර්තා කිරීම සඳහා ය (රණබාහු 2006: iii). එහි ප්‍රතිඵලයක්

ලෙස යටත්විජිත පාලකයින් සමඟ විදෙස් චිත්‍ර ශිල්පීන් මෙරටට පැමිණියහ. එබැවින් යටත්විජිත සිත්තරුන් විසින් අඳින ලද මෙම සිතුවම් යටත්විජිත රාජ්‍ය පිළිබඳ දෘශ්‍යමය වාර්තා වශයෙන් හඳුනා ගැනේ. මෙම සිතුවම්වල ස්වදේශික දේහය විවිධ අරමුණු නිරූපණය කිරීමේ අභිලාශයෙන් ස්ථානගත කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අතර ස්වදේශික ශරීර ස්වභාවය නිරූපණය කිරීම, සාමාන්‍ය ජන ජීවිතය දැක්වෙන අවස්ථා, භූමිදර්ශන සිතුවම්වල නිරූපිත කුඩා මානව රූප, දඬයම් දර්ශන ආදිය නිදසුන්වන අතර මෙම නිරූපණ තුළ දී ස්වදේශික රූපය ගොඩනැගීමේ දෘශ්‍යමය විකෘතිතා හා එයින් ව්‍යංගවත් කෙරෙන යටිපෙළ අරුත් පිළිබඳව මෙම ලිපියේ දී විමසා බැලේ. පර්යේෂණයට යටත් සිතුවම් බහුතරයක ස්වදේශික රූපය ගොඩනැඟීමේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනා ගන්නා ලදි. එනම් උඩුකය නග්න ස්ත්‍රී රූප සිතුවම් සඳහා සුලබව තේමා වීම, පුරුෂ ආකෘති 'S' හැඩති ආකෘතියකින් යුක්තව සිතුවම් කිරීම, ඇඳුම්-පැළඳුම් දැක්වීම හා පසුබිම් නිරූපණය මඟින් ස්වදේශිකයන්ගේ නො දියුණු භාවය තීව්‍ර කිරීම, විශාල භූ දර්ශන අවකාශ තුළ ස්වදේශිකයන්ගේ අප්‍රාණිකත්වය උත්ප්‍රාසවත් කිරීම සහ ඔවුන් හුදෙකලා කිරීම ආදී අවස්ථා ඉන් කිහිපයකි.


එලක අංක 01 හා 02 සිතුවම් මඟින් නිරූපණය කෙරෙනුයේ ස්වදේශික ශරීර ස්වභාවයන් ය. ඉන් පළමු වැන්නෙහි සිටින ස්වදේශිකයන් එකිනෙකා හා දොඩමලුව දැක්වෙන අතර දෙවැන්නෙහි සිටින ස්වදේශිකයන් සිතුවමට පෙනී සිටිනුයේ ඡායාරූපයකට මුහුණ පා සිටින ස්වරූපයකිනි. මෙම අවස්ථා ද්විත්වයේ දී ම සෘජු අවධානය යොමු වන්නේ ස්ත්‍රී චරිත වෙතට ය. ඔවුන්ගේ හිටි අභිනයන් හා දෙපාවල පිහිටුවීම මඟින් ස්ත්‍රී ලාලිත්‍ය තීව්‍ර කෙරෙන අතර උරපතු පිටුපසටත්, උඩුකය පපු පෙදෙස ඉදිරියටත් යොමුව සිටින පරිදි ශරීර ආකෘති ගොඩනැංවීම තුළ ස්ත්‍රී නිරුවත හා නිරුවත උත්ප්‍රාසවත් කිරීමේ යටත්විජිත රුචිකත්වයන් තීව්‍ර කෙරේ. මෙම ස්ත්‍රීන්ගේ උඩුකය නග්නව දැක්වෙන අතර යටිකය දිගු වස්ත්‍ර සහිතව නිරූපිත ය. යටත්විජිත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ සමාජ ස්තරායනය අනුව විළි වසා ගැනීමට

භාවිත වූ ඇඳුමේ විවිධත්වයන් අධ්‍යයනය කළ හැකි විය. ප්‍රභූ, සාමාන්‍ය, මධ්‍යම හා පහත් කුල වශයෙන් ඇඳුමෙන් තම සාමාජීය තත්ත්වය හෙවත් කුලයේ අනන්‍යතාවයන් නිරූපණය කරන ලදි. ඒ පුරාණ ස්ත්‍රියගේ ඇඳුම් පැළඳුම් උඩුකය නොවැසීම, රෙදි කඩකින් යටිකය වසාගෙන; සළුවකින් උඩුකය වැසීම, තන පට බැඳීම (තන පට බැඳි රෙදි කඩින් උඩුකය වැසීම), සැට්ටයකින් උඩුකය වැසීම, සැට්ටය සහ ඔසරියකින් උඩුකය වැසීම යනුවෙනි (වික්‍රමසිංහ 1962: 02). කුල ස්ථරායනය අනුව, උසස් කුල ස්ත්‍රීන් ඔසරියෙන් සැරසී සිටීමත් පහත් කුල ස්ත්‍රීන් උඩුකය නිරුවත් ව සිටීමත් යන අවස්ථා විදේශීය දෘෂ්ටියට ආගන්තකු භාවිතයකි. හෙට්ටිආරච්චිට අනුව, විළි බිය සම්හන්ධයෙන් විවිධ සමාජවල නොයෙතුත් මතවාද දැකිය හැකි ය; ඇතැම් සමාජවල ලිංගික නොවන වෙනත් ශරීරවයන් වසා ගැනීම විළි බිය හා සම්බන්ධව පවතී (1967: 133). එක් සමාජයක විළි යැයි සලකනු ලබන දෙය තවත් සමාජයක එසේ නො විය හැකි ය. සමාජය විසින් ගොඩනංවන ලද පොදු ඒකීය ධර්මතාවකට අනුව යම් පුද්ගලයෙක් ඇඳුම් ඇඳිය යුතු ආකාරය එනම්, ඔහු හෝ ඇය ජීවත්වන සමාජයට අනුරූපීව තීරණයවන බව මේ අනුව පැහැදිලි වේ. තත්කාලීන ශ්‍රී ලාංකේය සමාජ ස්ථරායනය අනුව පහත් කුල ස්ත්‍රීන් උඩුකය නිරුවත්ව සිටීම සාමාන්‍ය භාවිතයකි. එය බටහිර සංස්කෘතියට ආගන්තුක දෘශ්‍ය රූපකයක් වූ බැවින් රොඩී ස්ත්‍රීන් සුලභව සිතුවම් කර ඇත. නමුත් නිදර්ශිත සිතුවම්වල සිටින ස්ත්‍රීන් සියල්ලන් ම පාහේ අදාළ කුලය නියෝජනය කරන්නන් නොවේ. එනම් මෙම ස්ත්‍රීන්ගේ යටි කය වස්ත්‍රයේ ස්වභාවය හා ආභරණ දැරීම යන්නෙන් රොඩී යන්නට පරස්පර සමාජ තත්වයක් පිළිබඳව සංඥා සැපයේ. රොඩී කුල ස්ත්‍රීන්හට ආභරණ පැළඳීමට අවකාශ හිමි නොවූ අතර දණහිස දක්වා කෙටි යටි කය වස්ත්‍රයක් දැරීමට පමණක් අවකාශ හිමි විය (විජේකෝන් බණ්ඩා සහ විජේපාල 2014: 21). එවන් පසුබිමක සිතුවම් අතර හමුවන නග්නත්වය ප්‍රදර්ශනය කරන ස්ත්‍රීන් ශිල්පීය අවශ්‍යතාවයක ප්‍රතිඵලයකි. බොහෝ ස්ත්‍රී නග්න නිරූපණය කරන පත්‍රිරූප (කලාකරුවාගේ/ ප්‍රේක්ෂකයාගේ) පුරුෂ ලිංගික අභිලාෂයක් හෝ නියෝජනයක් එහි අඩංගුවන පවට ඉඟි කරයි

(ඩන්කන් 2008: 14). ඒ අනුව සැලකීමේ දී නිදර්ශිත සිතුවම්වල අන්තර්ගත වූ අඩ නිරුවත් ස්ත්‍රී ශරීර වනාහී යටත්විජිත කාරක පක්ෂයේ ලිංගික රුචිකත්වයන් පිළිබඳ සංඥාවකි. එමගින් අනෙකාගේ නිරුවත දැකීමට ඇති යුරෝපීය රුචිකත්වය මැනවින් ප්‍රදර්ශනය කෙරේ.



එලක අංක 01- Ceylon between Colombo and Kandy. Alexei Dmitrievich (1841)



එලක අංක 02- Village of Kalugannawa, Alexei Dmitrievich (1841)

ස්ත්‍රී රූපයට සාපේක්ෂව ස්වදේශික පුරුෂ රූප ස්ථානගත කිරීමේ දී සිතුවමේ කේන්ද්‍රීය අවධානයක් යොමු කර නොමැත. නිදසුන් ලෙස සිතුවම් රාමුවට කැපී යන අයුරින් සැළසුම්කරණය වූ පුරුෂ රූප ප්‍රබල ප්‍රකාශන රූපක වශයෙන් හඳුනාගත හැකි නොවේ (එලක අංක 02). එමෙන් ම පුරුෂ රූපවල ඉරියව් නිරූපණ මඟින් අවධාරණය කෙරෙනුයේ ස්ත්‍රී ස්වභාවයන් ය. ‘S’ හැඩති ශරීර ආකෘතිය හා වාඩි වී සිටින පුරුෂ රූප මඟින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ හඳුනා ගැනෙන පුරුෂයා පිළිබඳ ක්‍රියාශීලී, හැඩි දැඩි හෝ ප්‍රතාපවත් බව පිළිබඳ ප්‍රතිරූප විරූපණයක් නිරීක්ෂණය වේ. කෘශ වූ ශාරීරික ව්‍යුහ හා දිගටි අත් පා සහ කේෂ විලාසිතා මඟින් අවධාරණය කෙරෙනුයේ ස්වදේශිකයන්ගේ

අශිෂ්ඨත්වය හා යුරෝපීයයාගෙන් වෙනස්, අමුතු යන පෙරදිගවාදී හා යුරෝ-කේන්ද්‍රීය ආකල්පයන් ය (රූපය අංක 03).


"ඔවුහු දීප්තිමත් දුඹුරු ඡවි වර්ණයෙන් ද මනාව වැඩුණු සවිමත් අඟපසඟින් ද කාන්තිමත් කාල වර්ණ නෙත් සඟලින් ද ඝන කළු කේශ කලාපයෙන් යුත් වැඩිහිටියෝ ය; තරුණයෝ ය. වැඩිහිටියන් ඔවුන්ගේ කෙස් කළඹ ගෙල පසු පසින් ගැටයක් කොට රඳවන අතර තරුණයෝ එය ඔවුන්ගේ නිරාවරණ පුළුල් උර තලය මතැ ගලා යන සේ කඩා හෙළා ගෙන සිටිති. ලේන්සුවක් තුවායක් හෝ කපු රෙදි කඩක් ඔවුන්ගේ එකම ඇඳුම වශයෙන් ඉන වටා රුඳී තිබේ" (චාර්ල්ස් 2004: 15).



රූපය අංක 03- Singhalese Coolies, Eugene De Ransonnet (1867)

ඉහත සිතුවම් පිළිබඳව විමසීමේ දී හෙන්රි චා(ර්)ල්ස්ගේ ලිඛිත වාර්තාවල විස්තර කෙරෙන ඇතැම් ගුණාංගවල දෘශ්‍යමය ස්වරූපය පිළිබඳව අවබෝධයක් ලැබිය හැකි ය. ලිඛිත හා සිතුවම්ගත වාර්තාවල අන්තර්ගතයන් පිළිබඳව සැලකීමේ දී පැහැදිලිවන කරුණක් නම් ස්වදේශික පුරුෂ ශරීර ස්වභාවය පිළිබඳ වාර්තා කෙරෙනුයේ ස්ත්‍රී ලක්ෂණ අවධාරණයවන පරිද්දෙන් බවයි. නිදර්ශිත තෙවන රූපයේ දැක්වෙන පුරුෂ රූප කෙරෙන් එම ස්ත්‍රී ස්වරූපය අවධාරණය කෙරේ. මධ්‍යයේ

සිටින පුරුෂයාගේ බැල්ම මඟින් යටහත් පහත්, කීකරු භාවයන් ව්‍යංගවත් කෙරෙන අතර පුරුෂ රූපවල උඩුකය පපු පෙදෙසේ මාංශමය ස්වරූපය හා මධ්‍යයේ සිටින පුරුෂයා තම දෑත්වලින් උඩුකය වසා සිටින ස්වභාවය මඟින් පුරුෂ පෞරුෂත්වය අභියෝගයට ලක්කෙරේ. මෙම පුරුෂ රූපවල උඩුකය සෘජුව පැවතිය ද දෙනෙත් යොමුව ඇත්තේ නරඹන්නා වෙතට නොවේ. පුරුෂ මුහුණ රූප රාමුවේ ඉදිරියට යොමුව ඇති අවස්ථාවන් හි දී දෑස් ඉදිරියට යොමු නො කිරීමෙන් ස්ත්‍රී භාවයන් විශදවන බව සාමාන්‍ය පිළිගැනීමකි. ඉහත දැක්වෙන සිතුවම්වල නිරූපිත පුරුෂ ආලේඛ්‍ය රූප කෙරෙන් ග්‍රාමීය හා නො දියුණු භාවයන් තීව්‍ර කෙරේ. අවුල් සහගත දිගු කෙස් වැටිය, කේශ විලාසිතා, දිගු රැව්ල, උඩුකය නිර්වස්ත්‍ර වීම හා කෙටි රෙදි කඩකින් තම නිරුවත වසා සිටීම යන කරුණු හේතුවෙන් ස්වදේශික පුරුෂ ශරීරය විදේශිකයාගෙන් වෙනස්, අමුතු, අපූරු සහ අශිෂ්ට යන යුරෝ-කේන්ද්‍රීය මතවාදය තුළ ස්ථානගත කර තිබෙන බව පැහැදිලි ය. යටත්විජිත යුගයවන විට දුර්වල, කුඩාවට වැඩුණු පිරිමි ළමුන් සමච්චලයට ලක් කරමින් සමාජ ආන්තිකරණයට නතු විය (ද සිල්වා 2005: 172). ඒ අනුව සැලකීමේ දී ඉහත සිතුවම් බහුතරයක පුරුෂ ශරීරය චිත්‍රණය කිරීමේ දී ඉස්මතු වූයේ ඔතැනි හා බෙලහීන ස්වාභාවයන් බව හඳුනා ගැණිත. සිල්වාට අනුව, ක්‍රීඩා පිටියේ දැඩි ශික්ෂණය සංකේතවත් වූ මළල ක්‍රීඩා මත අවධානය යොමු කිරීම මඟින් කරන ලද්දේ පිරිමි ළමයින්ගේ මෘදු හැඩ නො ගැස්සුනු ශරීර රළු, මාංශ පේශි වැඩුණු, පුළුල් උර හා ගැඹුරු පපු ප්‍රදේශයකින් හෙබි විනයානුකූල තරුණයන් බවට පත් කිරීමටයි; ශාරීරික ශක්තිය ගාම්භාර්ථයෙන් ධෛර්යය හෙවත් නිර්භීතකමට ඈඳුණු අතර කායික අදක්ෂ බව, බියගුලුකම හෝ චරිතවත් නො වීමට සමාන විය (2005: 170). මෙම වික්ටෝරියානු ආකල්පවලට අනුව ස්වදේශික පුරුෂයින්ගේ මෘදු මාංශමය ශරීරය දැක්වෙන සිතුවම් මඟින් අනෙකාගේ අශිෂ්ට බව තීව්‍ර කිරීම නිර්මාණ ශිල්පීන්ගේ අරමුණ වී ඇති බව පැහැදිලි වේ.




ඵලක අංක 04- After the hunt at Bibile, Count Emanuel Andrasy



ඵලක අංක 5- Colonial life in Ceylon, 1886

යටත්විජිත කාරක පක්ෂය හා යටත්වැසි යන දෙපිරිස ම එක් අනුභූතියක් තුළ නිරූපණයේ දී සුවිශේෂී වෙනස්කම් රැසක් සහිතව දෙපාර්ශවයට අදාළ අවස්ථා නිරූපණය කිරීමට යටත්විජිත ශිල්පීන් උත්සුක වී ඇත (ඵලක අංක 04). මානව රූප දෙළහක් ආශ්‍රයෙන් මෙම සිතුවමේ අවස්ථා සංරචනය කර ඇත. ඉන් දෙදෙනෙක් විදේශිකයන් ය. සමස්ථ සිතුවමේ අවස්ථා ගොඩනඟා ඇත්තේ මෙම විදේශිකයන් දෙපළ කේන්ද්‍රියව ය. සෙසු ස්වදේශිකයන්ගේ ඉරියව් පිහිටුවීම මඟින් අවධාරණය කෙරෙනුයේ විදේශිකයන් හා ඔවුන් සිදු කරනු ලබන කාර්‍යයයි. සිතුවම මධ්‍යයේ සිට වම් පසට මඳක් නැඹුරුව ස්ථානගතව සිටින ස්වදේශිකයාගේ හිදි ඉරියව්ව හා දෑත් හි පිහිටුවීම මඟින් ඔහු විදේශීකයන්ගේ සේවයට කැප වී සිටින ස්වරූපය අවධාරණය කෙරේ. තත්කාලීන ඡායාරූප පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ස්වදේශිකයින් යටත්විජිත කාරකයාගේ සේවය උදෙසා කැපවී සිටිනයුරු පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි ය (ඵලක අංක 05). සිතුවමේ සෙසු ස්වදේශිකයන් සියල්ලන් ම ක්‍රියාශීලීත්වයෙන් තොර වූ හිටි අභිනයකට පමණක් සීමා වී

සිටින අතර විදේශිකයන්ගේ ඉරියව් පමණක් නාට්‍යානුසාරීව සංරචනය කර ඇත. ඵලක අංක 2 හා 4 යටතේ දැක්වෙන සිතුවම් ශිල්පීන් දෙදෙනෙකු විසින් නිර්මාණය කළ ද ඒවායේ නිරූපිත ඇතැම් චරිත හා එම චරිතවල ඉරියව් නිරූපණ එකිනෙක හා සමාන ලක්ෂණවලින් යුතු වේ.




ඵලක අංක 2 හා 4 හි සමීප රූප- Village of Kalugannawa සහ After the hunt at Bibile සිතුවම්වල සමීප දර්ශන. මෙම රූප සටහන් ද්විත්වයේ 1, 2, 3 වශයෙන් නම් කරන ලද චරිත හා ඒවායේ ඉරියව් නිරූපණයන් එකිනෙක හා සමාන ලක්ෂණවලින් සමන්විත වේ.


මේ අනුව පැහැදිලිවන කරුණක් නම් මෙම සිතුවම් තත්කාලීන යටත්විජිත ශ්‍රී ලංකාව පිළිබඳ දෘශ්‍යමය වාර්තා ලෙස නිර්මාණය කෙරුණ ද ශිල්පීය රුචිකත්වය එම නිර්මාණයන්ගේ දෘශ්‍ය සංකතන ගොඩනැගීමෙහි ලා බලපෑම් සිදු කර ඇති බවයි. ඒ අනුව තෝරාගත් ඉරියව් සහ පුද්ගල රූප යටත්විජිත සිතුවම් අතර පුණරුච්චාරණය වී ඇත. නිදසුන් ලෙස 'S' හැඩති පුරුෂ ආකෘති, වැතිර සිටින පුද්ගල රූප, ක්‍රියාශීලීත්වයෙන් තොර හිටි ඉරියව් මෙන් ම දරුවන් ඇකයේ හොවා

සිටින ස්ත්‍රීන් සහ වයෝවෘද පුද්ගල රූප ශිල්පීය අභිරුචිය මත ස්වකීය නිර්මාණ තුළ ස්ථානගත කර ඇති බව නිරීක්ෂණය වේ.

එලක අංක 06 සිතුවමෙ හි නිරූපිත ස්වදේශික රූප පිළිබඳව සැලකීමේ දී එම චරිත ශිල්පීය රුචිකත්වය මත අහඹු ලෙස ස්ථානගත කරන ලද දෘශ්‍ය කේතයන් වශයෙන් හඳුනාගත හැකි ය. මෙම ස්වදේශික රූප වැවිලි ආර්ථිකයට අවශ්‍ය 'ලාබ ශ්‍රමය ලබා ගැනීම' පිළිබඳව අදහස සූචනය කිරීම පිණිස යොදාගත් සංකේත වේ යැයි උපකල්පනය කළ හැකි ය. මෙම සිතුවම තුළ වඩාත් ප්‍රමුඛත්වයට පත්ව ඇත්තේ ස්වදේශික භූමිය මිස ස්වදේශික වැසියන් නොවේ. ස්වදේශික දේහය මෙම සිතුවමෙ හි නිරූපණය කෙරෙනුයේ සිතුවම සමබර කිරීමේ අරමුණින් හෝ යටත්විජිත කාරකයින්ගේ බලය හුවා දැක්වීම සඳහා ය. භූමි දර්ශනය තුළ මානව සිරුර ස්ථානගත කිරීමේ දී එහි පරිමාණය ඉතා කුඩාවන අතර පසුබිම සඳහා විශාල අවධානයක් යොමු කර ඇත. ඇතැම් අවස්ථාවල භූමි දර්ශනය තුළ ස්වදේශික දේහය ස්ථානගත කර ඇත්තේ බෙහෙවින් අලස, කම්මැලි ජන කොටසක් ය යන දෘෂ්ටියෙන් යුතුව ය (එලක අංක 07, 08). නමුත් මානව රූප අතර විදේශික චරිත වේ නම් ඒවා ස්වදේශික දේහයට සාපේක්ෂව තරමක් විශාලව මෙන් ම ඉදිරිගාමී ලෙස සංරචනය කර තිබේ.



එලක අංක 06- The summit of the Balani Mountain, LT.William Lyttleton (1819)
නාගරීකරණය නොවූ හිස් තැනිතලා භූ විශමතාවන්හි පිහිටීම හා වැවිලි කර්මාන්තයට හිතකර බව ව්‍යංගවත් කිරීම. මෙහි ස්වදේශික මානව දේහය ද්විතීක දෘශ්‍ය අරමුණක් වශයෙන් දක්වා ඇති අතර එම නිරූපණ වැවිලි කර්මාන්තයට අවැසි මානව ශ්‍රමය ලබා ගැනීම පිළිබඳ ඇඟවීමක් වශයෙන් ගිණිය හැකි ය.



එලක අංක 07- Badulla, Friedrich Wilhelm Waldemar (1853)
අලස, කම්මැලි ජන කොටසක් වශයෙන් ස්වදේශික සිරුරු ප්‍රතිනිර්මාණය කිරීම



එලක අංක 08- Adam's peak and slave Island from the galle face Esplanade, John Deschamps (1845)

දඩයම් දර්ශන නිරූපිත අවස්ථා ඊට නිදසුන් ලෙස දැක්විය හැකි ය (එලක අංක 09). මෙම ප්‍රධාන භූ දර්ශනය තුළ ස්වදේශික ශරීරය පිහිටුවා ඇත්තේ බොහෝ විට නො වැදගත් චරිතයක් හෝ යුරෝපීයයාගේ යටත්

වැසියෙකු බවට නැතහොත් ඔහුගේ සුව පහසුව වෙනුවෙන් කැපවී සිටින්නෙකු වශයෙන්වන අතර යටත්විජිත කාරකයින්ගේ වික්‍රමාන්විත බව අතිශයෝක්තියෙන් දක්වා ඇත. එනම් විදේශිකයන් ගිනිඅවි ගෙන නුදුරෙහි වූ තම දඩයම වෙතට ඉලක්කය ගනිමින් සිටිනයුරු දැක්වෙන අතර ඊට සාපේක්ෂව ස්වදේශිකයන්ගේ අභිනයන් හුදු සිටගන සිටීමකට සීමා කර දැක්වීමයි. යටත්විජිත කාරකයින් නිරූපණයේ දී තුවක්කු අත දැරීම, අලි ඇතුන්ට වෙඩි තැබීම,



එලක අංක 09- Stalking Elephants, Emanuel Andrasy (1853)

දඩයමට වඩාත් සමීපව හිද ඉලක්කය ගැනීම හා ස්වදේශිකයාට සාපේක්ෂව වඩාත් ඉදිරිගාමීව දැක්වීම වැනි ලක්ෂණ මඟින් අනෙකා පහත් කොට යටත්විජිත කාරකයා ප්‍රමුඛත්වයට පත්කෙරේ. එය මෙම වස්තුවිෂය තේමා වූ සිතුවම් බහුතරයකට ම පොදු වූ ලක්ෂණ වශයෙන් හඳුනාගත හැකි ය. විදේශික ශරීර "V" හැඩය තුළත් ස්වදේශික ශරීර "S" හැඩය තුළත් සංරචනය කිරීම යන ද්විත්වතා යටත්විජිත කාරකයාගේ හා අනෙකාගේ පුද්ගල පෞරුෂත්වය පිළිබඳ සංකේත වශයෙන් හඳුනාගත හැකි ය. දඩයම් දර්ශන දක්වෙන යටත්විජිත ඡායාරූප නිරීක්ෂණයේ දී වීරත්වයට පත්වීමේ විජිතවාදී රුචිකත්වයන් මැනවින් නිරීක්ෂණය වේ (එලක අංක 10). ඡායාරූපයට අනුව, විදේශිකයන් මියගිය දැවැන්තයාගේ

ශරීරයේ උදරය, කද, ගාත්‍රාදිය මත වැතිරී සිටිය දී ස්වදේශිකයා එම දඩයක්කාරයාගේ පාදාන්තයේ වාඩි වී සිටියි. ඔහු අසුන්ගත් ඉරියව් තුළ වුව ද බිය, යටහත්-පහත් භාවය හා පක්ෂපාතීත්වයන් හඳුනාගත හැකි ය.



එලක අංක 10- Franz Ferdinand and Friends with one of the elephants he killed in Kalawela, Ceylon, in January 1893, Photographer Unknown

ඊට සාපේක්ෂව විදේශික සිරුරේ ඉරියව් අධ්‍යයනයේ දී ඉතා නිදහස් හා වික්‍රමාන්විත අභිනයන් නිරීක්ෂණය වේ. නිදසුන් ලෙස ඡායාරූපයේ වම් කෙළවර සිටින විදේශිකයාගේ ඉරියව් නිරූපණයන් පෙන්වාදිය හැකි ය. මෙම ඡායාරූපයෙහි දැක්වෙන පරිදි වඩාත් ඉදිරිගාමී, දක්ෂ පුද්ගලයා වන්නේ යටත්විජිත කාරකයා ය. ඒ නිසා යටත්විජිත වැසියා ඔහු ආදර්ශයට ගත යුතු ය යන්න මෙමඟින් අවධාරණය කෙරේ. මෙහි නිරූපිත ස්වදේශිකයා කිසිදු වික්‍රමාන්විත භූමිකාවක් රඟ නොපායි; යුරෝපීයයාගේ යටහත්-පහත් සේවකයෙකු ලෙස පමණක් පෙනී සිටියි. එබැවින් මෙම නිරූපණය වනාහී යටත්විජිත සිතුවම්වල හඳුනාගත් පොදු ලක්ෂණවල දිගුවක් ලෙස නිරීක්ෂණය වේ.

**සමාලෝචනය**

මානව ශරීරය කෙරෙන් නිරීක්ෂණය කළ හැකි දේශපාලනික ගතිකයක් වශයෙන් ස්ත්‍රී පුරුෂභාවය සුවිශේෂී වේ. ලිංගිකත්වය පදනම් කර ගත් දේශපාලනයෙන් බැහැර වූ කළ ශරීරය කෙරෙන් සමාජ තරාතිරම පිළිඹිබු කිරීමේ දේශපාලනිකත්වයක් ද නියෝජනය කෙරේ. 'ශරීරය' බලය ලබා ගැනීම සඳහා දේශපාලනිකමය උපක්‍රමයක් වශයෙන් සමාජය තුළ භාවිතා වී තිබේ (ෆූකෝ 2007: 100). මේ අනුව සැලකීමේ දී යටත්විජිතකරණ ක්‍රියාවලිය තුළ දී යටත්විජිත කාරකයා ස්වකීය බලය, ශක්තිමත් භාවය හා ශිෂ්ට සම්පන්න භාවය යන සියලුම දේ යටත් වැසියාහට ඒත්තු ගන්වන ලද්දේ ස්වකීය ශරීරය මූලිකත්වයෙනි. එහි දී ශරීරය මුල්කොට ගනිමින් දේශපාලනික ආයෝජනයක් සිදු විය. ශරීරය පිළිබඳව දැකීම හා ශරීරයේ ක්‍රියාවලීන් පිළිබඳව දැකීම ශරීරයේ දේශපාලනිකත්වය වශයෙන් හැඳින්විය හැකි ය (ෆූකෝ 2007: 102). මුවර්ට අනුව, අධිරාජ්‍යය ගොඩනගන්නන්ගේ ප්‍රතිමූර්තිය වන්නේ උස් වූ, පළල් උර ඇති, ළා දුඹුරු පැහැති හිස කෙස් සහ නිල් පැහැති ඇස් ඇති වීරයෙකි (උපුටා ගැනීම ද සිල්වා 2005: 175). මේ අනුව, වික්ටෝරියානු පිරිමිකමේ මූලික ගති ලක්ෂණ ලෙස සිරුර, ශරීරය මූර්තිමත් කිරීමේ ආකාරය, ශාරීරික ප්‍රයුක්තිය, නිර්භිතත්වය සහ වික්‍රමාන්විත බව යනාදී සාධක කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමුව තිබේ. ඊට සාපේක්ෂව විජිතවාදීන් විසින් විජිතවාසී මානව දේහය පිළිබඳව ප්‍රතිරූප ගොඩනගන ලද්දේ එයින් ප්‍රතිපක්ෂ ආකෘතියකිනි. බහුතරයක් සිතුවම් තුළ ස්වදේශික ශරීරය පිහිටුවා ඇත්තේ බොහෝ විට නො වැදගත් චරිතයක් හෝ යුරෝපීයයාගේ යටත්වැසියෙකු බවට නැතහොත් යුරෝපීයයාගේ සුව පහසුවු වෙනුවෙන් කැපවී සිටින්නේකු වශයෙනි. ඇතැම් අවස්ථාවල භූමි දර්ශනය තුළ ස්වදේශික දේහය ස්ථානගත කර ඇත්තේ බෙහෙවින් අලස, මන්දෝත්සාහී ජන කොටසක් ය යන දෘෂ්ටියෙන් යුතුව ය. මානව සිරුර ස්ථානගත කිරීමේ දී එහි පරිමාණය ඉතා කුඩාවන අතර පසුබිම සඳහා විශාල අවධානයක් යොමු කර ඇත. නමුත් මානව රූප අතර විදේශික චරිත වේ නම් ඒවා ස්වදේශික දේහයට සාපේක්ෂව තරමක් විශාලව මෙන්

ම ඉදිරිගාමී ලෙස සංරචනය කර තිබේ. වැවිලි කර්මාන්තය හා දඩයම් දර්ශන නිරූපිත අවස්ථාවන් නිදසුන් ලෙස දැක්විය හැකි ය. සංඛ්‍යාත්මකව සැලකීමේ දී මෙම බහුතරයක් සිතුවම් තුළ යටත්විජිත ස්වදේශික මානව නිරූපණයන් බහුල වුව ද ඔවුන්ගේ අභිනය පිහිටුවීම් මඟින් නිරීක්ෂණය වනුයේ නිර්ප්‍රභූ භාවයකි. එනම් පහත්, නොදියුණු, මර්ධනයට ලක් වූ යන්න ප්‍රකට කෙරේ. අන්තෝනියෝ ග්‍රාම්ස්චිට අනුව, නිර්ප්‍රභූ යනු පාලක පන්තියේ ආධිපත්‍යයට නතු වන්නා ය (පතිරගේ 2005: 91). ඒ අනුව, මෙහි පාලක පන්තිය නිරූපණය කෙරෙන දෘශ්‍ය කේතය වනුයේ යට කී යටත්විජිත කාරකයා ය. මෙම සිතුවම් තුළ යටත්විජිත කාරක පක්ෂයේ නියෝජනය එක් චරිතයකට පමණක් සීමා වූ අවස්ථාවල දී පවා ඔහුගේ ඉරියව් මඟින් ස්වකීය ප්‍රභූ භාවය තහවුරු කර තිබේ. ඇතැම් සිතුවම් මඟින් නිරූපණය කෙරෙනුයේ ශිල්පියාගේ විධානයට අනුව නතර කරන ලද ක්‍රියාකාරකම් සමූහයක එකතුවක් වුව ද ස්වදේශික ශරීරවල ඉරියව් හුදෙක් සාමන්‍ය සිටගෙන සිටීමකට පමණක් සීමා කර තිබේ. ඊට සාපේක්ෂව යටත්විජිත කාරකයාගේ ප්‍රාණ පූර්ණ ඉරියව් නිරූපණයන් මඟින් ඔහුගේ අධිපතිභාවය සහ ස්වදේශිකයන්ගේ අප්‍රාණිකත්වය ඉස්මතු කර පෙන්වා තිබේ.

ශරීර ඉරියව් නිරූපණය මෙන් ම කායිකත්වය නිරූපණය මඟින් ද ප්‍රභූත්වය හිමි වී ඇත්තේ යටත්විජිත කාරක පක්ෂය වෙතට ය. ඒ අනුව, දුඹුරු හම සහිත ස්වදේශික ශරීර අතර ඇති සුදු පැහැති කෙකේෂියානු ශරීර ලක්ෂණ විශද කරවන පුද්ගල රූප සඳහා සිතුවමේ කේන්ද්‍රීය අවධානයක් හිමිව ඇති බව නිරීක්ෂණය විය. එම විදේශික චරිතවල ස්ථානගත වීම අනුව ද සෙසු ස්වදේශික චරිතවල යටහත් පහත්, බෙලහීනත්වය අවධාරණයට ලක් කෙරේ. සිතුවමේ මධ්‍ය ලක්ෂය නරඹන්නාගේ ඍජු අවධානයට ලක් වේ. ඇතැම් සිතුවම්වල මධ්‍ය චරිතය වී ඇත්තේ යටත්විජිත කාරකයා ය. එහි දී සිතුවමේ සමමිතික තිරස් හා සිරස් අක්ෂ ඡේදනයවන මධ්‍ය ලක්ෂය මත විදේශික ශරීරය නාබිගත කෙරේ. සිතුවමේ මධ්‍යගත චරිතය ඍජුව නෙත ගැටීම හරහා ඔහු කෙරෙන් ප්‍රකාශිත බලය හා ප්‍රභූත්වය ආදී සංඥාවන් ද ඍජුව නරඹන්නා

වෙතට ආමන්ත්‍රණය කරන අතර සෙසු පාත්‍ර වර්ගයෝ අවශේෂ ප්‍රාණීන් බවට පත් කෙරේ. ඉහත රූපවල දැක්වෙන පරිදි යටත්විජිත කාරකයාගේ හිස ඇස් මට්ටමේ පිහිටන අතර ස්වදේශිකයන්ගේ හිස ඇස් මට්ටමෙන් මදක් පහළටවන සේ පිහිටුවා තිබේ. විදේශික චරිත සිතුවමේ දකුණු හෝ වම් අර්ධයටවන සේ පිහිටන අවස්ථාවන්හි දී එම චරිතය සෙසු ස්වදේශිකයන්ගෙන් වෙන්කොට දැක්වීමේ අරමුණින් අදාළ චරිතය ඉහළින් ස්ථානගත කිරීම හෝ ඉරියව් මඟින් අනෙකාගෙන් වෙනස් අභිනයන් සහිතව දැක්වීම හෝ ඇඳුම්-පැළඳුම් මඟින් ප්‍රභූත්වය සංකේතවත් කිරීමට උත්සුක වී ඇත. නොඑසේනම් අනෙකාගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ප්‍රභූත්වය අත්පත් කොටගෙන තිබේ. එම සෑම ස්ථානගත කිරීමක් හරහා සිතුවම් තුළ ස්වදේශික චරිත ද්විතියික අරමුණක් බවට පත්ව ඇත.

ඇඳුම්-පැළඳුම් නිරූපණය මඟින් ද වඩාත් සුවිශේෂී වී ඇත්තේ යටත්විජිත කාරක පක්ෂයයි. සිතුවම්වල නිරූපිත විදේශිකයන් සියල්ලන් ම පාහේ උඩුකය සඳහා කමිසයක් සහ කබායක් (coat) ද යටිකය සඳහා දිගු කලිසමක් ද හිස තොප්පි ද පාද සඳහා බූට් සපත්තු ද පැළඳ සිටිති. ස්වදේශික පුරුෂයින්ගේ ඇඳුම් විලාසිතාව වී ඇත්තේ උඩුකය නිරුවත්ව හෝ කමිසයක් සහ යටිකය සඳහා සරමකි. ඇතැම් අවස්ථාවල දී එක් උරයක රෙදිකඩක් රුවාගෙන සිටි යි. ස්වදේශික කුඩා දරුවන් පූර්ණ නග්න ස්වරූපයෙන් සිතුවම් අතර හමු වේ. තත්කාලීන කුල ස්ථරායනය හමුවේ රොඩී ස්ත්‍රීන් උඩුකය නිරුවත්ව සිටීම සාමාන්‍ය වුව ද එය යුරෝපීයයාට ඉතා ආගන්තුක භාවිතයකි. ස්වදේශික ඇඳුම්වල පවතින යට කී විවිධත්වයන් ඉස්මතු කර පෙන්වීම හරහා ස්වදේශිකයා, යුරෝපීයයාගෙන් වෙනස් වූ, අරුම පුදුම, අපූර්ව ජන කණ්ඩායමක් බවත්, ශිෂ්ඨකරණය කළ යුතු, නො දියුණු, ග්‍රාම්‍ය ස්වභාවයත් තීව්‍ර කෙරේ. එම එළඹවීම් වඩාත් තහවුරු කෙරෙනුයේ ස්වදේශික සිරුරු අතරට යටත්විජිත කාරකයාගේ දෘශ්‍ය රූපයක් ස්ථානගත කිරීම මඟිනි. පුරුෂ ආලේඛ්‍ය රූප නිර්මාණය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ ද ස්වදේශික පුරුෂ පෞරුෂත්වය හෑල්ලුවට ලක්කරවීමයි. මෙය යුරෝපීය චින්තනය

අනුව ගොඩනැගුණු ප්‍රාචීනවාදය නැමති ආකල්පයේ දිගුවකි. ප්‍රාචීනවාදය යනු, 'බටහිර වැසියා' පෙරදිග පිළිබඳව ඥාණනය කරනු ලැබූ පිළිවෙළකි (පතිරගේ 2005: 95). එනම් පෙරදිග වැසියාගේ ජීවන ශෛලී, ලෝක දෘෂ්ටි සහ ලෝක සම්මත පිළිබඳව කරනු ලැබූ ලේඛනගත කිරීමක් ලෙස හැඳින්විය හැකි ය. වඩාත් වැදගත් දෙය නම් මෙම ලේඛනගත කිරීම අතිශයින් ම මානවවංශ කේන්ද්‍රීය විමයි. එනම් බටහිර දෘෂ්ටි කෝණයට අනුව පෙරදිග වැසියා මාන ගත කිරීමයි. එනම් යුරෝපීය දැනුම් පද්ධති මඟින් 'අනෙකා' ගොඩනැංවීමත් ඒ මඟින් පෙරදිග වැසියා මත හෙළන තම බලය සුජාත කිරීමකි. ඒ අනුව, බටහිර ප්‍රාචීනත්වය පිළිබඳ කතිකාව තුළ පෙරදිග වැසියා අශිෂ්ට, ම්ලේච්ඡ, නො දියුණු, පසුගාමී ආදී සියලු දුර්ගුණයන්ගෙන් යුක්ත පුද්ගලයෙක්වන අතර ඔවුන්ව ශිෂ්ට සම්පන්න කිරීමේ, දියුණු කිරීමේ ක්‍රියාවලිය සඳහා දේව බලය ඇත්තේ බටහිරයාට බව අවධාරණය කෙරේ.

**නිගමනය**

මෙම අධ්‍යයන කාර්යය ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය යටත්විජිත සිතුවම් ශිල්පයේ පළමුවන සියවස ඉක්මවන තරම් කාලයක් පුරා එහි චර්යා විමර්ශනය කරනු ලැබූවකි (ක්‍රි.ව 1800-1900). යටත්විජිත සිතුවම් ශිල්පයේ සම්ප්‍රාප්තිය අධිරාජ්‍යවාදී දේශපාලනික අවශ්‍යතාවයක් මත සිදු විය. තත්කාලීනව ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීමේ නියැලී සිටියේත් යටත්විජිත ශ්‍රී ලාංකේය බ්‍රිතාන්‍ය පාලකයින් සහ ඔවුන්ගේ නියෝජිතයන් වශයෙන් මෙහි පෙනී සිටි රාජ්‍ය නිලධාරීන් හා වැවිලි කර්මාන්තයේ නියුතු විදේශිකයන් ය. මේ අනුව, ඉතා පැහැදිලි ලෙස පෙනී යන කරුණක් වන්නේ ලක්දිව මුල් කාලීන සිතුවම් ව්‍යවහාරය මුලුමනින් ම මෙරට වාසය කළ හා සංචාරය කළ යටත්විජිත කාරකයන්ට පමණක් සීමා වූ බවයි. සිතුවම් ශිල්පය මෙරට ජන සමාජයේ පංතිමය වරප්‍රසාදයක් විය. එමඟින් ස්වදේශික ජන සමාජයට කිසිදු මෙහෙවරක් සිදු නොවූ අතර, මෙරට පාලකයන් හා ඔවුන්ගේ නියෝජිතයන් අතර සම්බන්ධීකරණය උදෙසා ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වී ඇත. කලා කෘති

කිසියම් අවධියක, කිසියම් ජාතියක, කිසියම් ජන කොටසක හෝ කිසියම් පුද්ගලයෙකුගේ චරිත ලක්‍ෂණ පිළිබඳව කැපී පෙනෙන සහ සුවිශේෂී සාධක සපයන අතර කලා කෘතියක පෙනීම නැතහොත් දෘශ්‍යමය ලක්‍ෂණ එය බිහිවන ඓතිහාසික අවස්ථාවේ ප්‍රතිඵලයක් ද වේ (වීරසිංහ 2005: 5). ප්‍රොසෙයිසිට අනුව කලා කෘති යනු එය නිෂ්පාදනය කළ පුද්ගලයාගේත් ඔහු හෝ ඇයගේ සමාජ සංස්කෘතික සහ ඓතිහාසික සන්ධර්භයේ අරමුණු, අගේකිරීම්, ආකල්ප, අදහස් හා ආවේශ, අපේක්ෂිත සහ අනපේක්ෂිත නරඹන්නන් සමූහයක් වෙත ගෙන යන වාහනය වේ (උපුටා ගැනීම වීරසිංහ 2005: 7). ඒ අනුව මෙම සිතුවම් නිර්මාණය කිරීමේ මුඛ්‍යතම පරමාර්ථය වූයේ යටත්විජිත පිළිබඳ තොරතුරු අධිරාජ්‍යයට වාර්තා කිරීමයි. අධ්‍යයන ප්‍රතිඵල අනුව, පහත සඳහන් නිරීක්‍ෂණයන් හඳුනාගත හැකි විය. 19 වැනි සියවසේ දී ස්වදේශිකයන්ගෙන් සිදු වී ඇත්තේ අන්‍යයින්ගේ අවශ්‍යතාව හා බලකිරීම හෝ නො දැනුවත්ව හෝ සිතුවම්වලට පෙනී සිටීම පමණි. බහතුරයක් සිතුවම්වල ස්වදේශික දේහය පහත් නො දියුණු යන යුරෝ-කේන්ද්‍රීය මතවාදය තුළ ස්ථානගත කර තිබිණි. ඇතැම් සිතුවම් තුළ ස්වදේශික දේහය යටත්විජිතවාදීන්ගේ ශාරීරික සැකැස්මෙන් වෙනස්වන අතර ඇඳුම්-පැළඳුම් භාවිතය මඟින් අපූර්ව, විවිධ යන පෙරදිගවාදී ඇඟවීම් පිළිඹිබු කිරීම සඳහා අරමුණු කර තිබේ. එමෙන් ම යටත්විජිතවාදී මිනිස් ශ්‍රමය ආර්ථික ප්‍රතිලාභ ලැබිය හැකි ප්‍රවේශයක් වශයෙන් පෙන්වාදෙන අතර ස්වදේශික ස්ත්‍රිය ලිංගික උත්පේරණ මාධ්‍යයක් ලෙස භාවිතා කර තිබේ. එමඟින් යුරෝපීයයා හෙවත් යටත්විජිතවාදියාගේ ලෝකය දැකීමේ තිබූ ඌන දෘෂ්ටියත් ඒ මත පදනම් වූ දේශපාලනික රුචිකත්වයත් මැනවින් විශද වේ. මේ අනුව, යටත්විජිත සිතුවම් වනාහී යටත්විජිතවාදී බල දේශපාලනික ව්‍යාපෘතියේ ප්‍රචාරක හා වාර්තාකරණ මාධ්‍ය වශයෙන් පෙනී සිට ඇති බව පැහැදිලි වේ. එමෙන් ම යටත්විජිත සිතුවම්වල නිරූපිත ස්වදේශික දේහය, ස්වකීයයන්ගේ බලය සහ අධිකාරය ව්‍යංගවත් කිරීමේ අරමුණින් යටත්විජිත සිත්තරුන්ගේ රුචිකත්වයට අනුරූපීව සැලසුම්කරණය වී ඇති බව නිගමනය කළ හැකි ය.

## ඵලක නාමාවලිය

**1-** Ceylon between Colombo and Kandy, Alexei Dmitrievich (1841)" Water colour on Paper, Image sited De silva 1998: 149

**2-** Village of Kalugannawa, Alexei Dmitrievich (1841), Water colour on Paper, Image sited De silva 1998: 151

**3-** Singhalese Coolies, Eugene De Ransonnet (1867), Water colour on Paper, Image sited De silva 1998: 279

**4-** After the hunt at Bibile, Count Emanuel Andrasy (1853), Water colour on Paper, Image sited De silva 1998: 211

**5-** Colonial life in Ceylon, 1886, Photographer Unknown, Image sited royal commonwelth society web site

**6-** The summit of the Balani Mountain, LT.William Lyttleton (1819), Water colour on Paper, Image sited De silva 1998: 48

**7-** Badulla, Friedrich Wilhelm Waldemar (1853), Water colour on Paper, Image sited De silva 1998: 173

**8-** Adam's peak and slave Island from the galle face Esplanade, John Deschamps (1845), Water colour on Paper, Image sited De silva 1998: 109

**9-** Stalking Elephants, Count Emanuel Andrasy (1853), Water colour on Paper, Image sited De silva 1998: 210

**10-** Franz Ferdinand and Friends with one of the elephants he killed in Kalawela, Ceylon, in January 1893, Photographer Unknown, Image sited royal commonwelth society web site

## ආශ්‍රිත ග්‍රන්ථ

ආරියදාස, කීර්ති. 2004. *දේශපාලන විද්‍යාව: න්‍යාය, සංකල්ප, මතවාද*. පන්නිපිටිය: කතෘ ප්‍රකාශන

කහඳගම, අනුෂ්කා. 2012. "පුරුෂත්වය අධ්‍යයනික අවකාශයක් ලෙස පිරිමින්ට පමණයි", *සංස්කෘති (විචාර සංග්‍රහය),* (22 කලාපය), බොරලැස්ගමුව: සංස්කෘති ප්‍රකාශන, (පිටු අංක 47-61).

චාර්ල්ස්, හෙන්රි (පරිවර්තනය: ප්‍රේමචන්ද්‍ර අල්විස්). 2004. *ලංකාව හා සිංහලයෝ.* කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

ජයතිලක, ජේ.ඒ.වී.එන්. 2017. "බෞද්ධ විහාර කලාව විෂයෙහි යුරෝ-කේන්ද්‍රීය දෘෂ්ටිවාදයේ බලපෑම: 19 වන සියවසේ පහතරට විහාරවල නිරූපිත යටත්විජිත කලා ලක්ෂණ පිළිබඳ පාඨනයක්", *මංගලිකා ජයතුංග ප්‍රනාභිවන්දනා: ජයතු*. කැලණිය: ලලිත කලා අධ්‍යයනාංශය, කැලණි විශ්වවිද්‍යාලය, (පිටු අංක 283-298).

ඩන්කන්, කැරල් (පරිවර්තනය: අනෝලී පෙරේරා). 2008. "විසිවන සියවස මුල් යුගයේ පෙරටුගාමී චිත්‍ර තුළ පිළිබිඹුවන පුරුෂත්වය හා අධිපතීත්වය", *Art Lab: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, පස්වන සහ හයවන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 7-41).

ද සිල්වා, ජනී. 2005. "සිංහල කතිකාව තුළ වික්ටෝරියානු පිරිමිකම සහ පුරුෂත්වය පිළිබඳ දේශීය කේත", *පඨිත,* තෙවන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය, (පිටු අංක 165-229).

නොක්ස්, රොබට්. 2001. *එදා හෙලදිව*. කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

පතිරගේ, ජගත් බණ්ඩාර. 2005. "පශ්චාත් යටත්විජිතවාදී කතිකාවට ප්‍රවේශයක්", *පඨිත*, තෙවන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය, (පිටු අංක 77-115).

පෙරේරා, රංජිත්. 1993. නිර්ප්‍රභූ පර්යාවලෝකය: මානසිකත්වය යටත්විජිතහරණයකට කිරීමේ ලා උපාය මාර්ගයකි". *ප්‍රවාද*, 5වන කලාපය. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය, (පිටු අංක 23-32).

පෙරේරා සසංක. 2017. "සොරා ගැනීමේ සහ මංකොල්ලකෑමේ අයිතිය: පන්සිය වසරකට පසුව", *සංස්කෘතිය සහ දැනුම පිළිබඳ දේශපාලනය*, දෙවන වෙළුම. කොළඹ: තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 349-358).

පෙරේරා සසංක. 2017. "සංස්කෘතික හා මතවාදීමය නිෂ්පාදනයක් වශයෙන් ගම පිළිබඳ අදහස: බහුවිධ නිරූපණ පිළිබඳ අසම්පූර්ණ කියවීමක්", *සංස්කෘතිය සහ දැනුම පිළිබඳ දේශපාලනය*, දෙවන වෙළුම. කොළඹ: තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 371-390).

පෙරේරා සසංක. 2006. "නිවාස සංකීර්ණ ඇසුරුම් කළ මනස්සෘෂ්ටි ලෙස: ආස්ථානීයත්වයේ දේශපාලනය සහ රුචිකත්වය ප්‍රමිතිගත කිරීම", *පඨිත*, සිව්වන වෙළුම. කොළඹ: සමාජ සංස්කෘතික තීව්‍ර අධ්‍යයනය සඳහා වූ කොළඹ ආයතනය, (පිටු

අංක 48-85).

පෙරේරා සසංක. 2005. "කලාවේ දේශපාලනයඃ කතළුවේ නවමුනි විහාරයේ ඕලන්ද බිතු සිතුවම්වල නැගීම සහ බැසීම පිළිබඳ එක් පාඨනයක්", *Art Lab: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, තෙවන සහ සිව්වන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 55-82).

පෙරේරා සසංක. 1995. "භාෂා අධිරාජ්‍යවාදයේ අණසක", *කලා සංස්කෘති විමර්ශන*, වසන්ත කලාපය, පළමු වෙළුම. නුගේගොඩඃ විභවි සංස්කෘතික මධ්‍යස්ථානය, (පිටු අංක 7-16).

වික්‍රමසිංහ, මාර්ටින්. 1962. *පුරාණ ස්ත්‍රීන් ගේ ඇඳුම්*. කොළඹඃ ඇම් ඩී. ගුණසේන.

වීරසිංහ ජගත්. 2005. "කලාව පිළිබඳ සිතීමේ/ ලිවීමේ ඉතිහාසය හෙවත් කලා ඉතිහාසය ලිවීම", *Art Lab: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, තෙවන සහ සිව්වන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 3-30).

ශනාතනන්, ටී (පරිවර්තනයඃ සාමිනාදන් විමල්). 2008. "අනෙකාව තියුණු අවලෝකනයකට ලක් කිරීමඃ ලයනල් වෙන්ඩ්ට් සහ ඩේවිඩ් පෙයින්ටර්ගේ චිත්‍රවල පුරුෂ ශරීරය", *Art Lab: කලාව සහ උරුමය පිළිබඳ ප්‍රකාශන මාලාව*, පස්වන සහ හයවන වෙළුම. පිටකෝට්ටේ තීර්ථ ජාත්‍යන්තර කලාකරුවන්ගේ එකතුව, (පිටු අංක 67-92).

හෙට්ටිආරච්චි, ඩී. ඊ. 1967. ඇඳුම, *සිංහල විශ්වකෝෂය 3වැනි කාණ්ඩය.* කොළඹඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Bruce, Janine. 2010. "Representations of 'The Other' in Colonial Photography", Image and Imagining the Pacific. [Online]. Available at: <https://mail.gogle.com/mail/#inbox/15824901b0ee3d5?projector=1> [Accessed 13 November 2016].

De Silva, R.K. 1998. *19th Century Newspaper engravings of Ceylon.* London: Serendib Publications.

Foucault, Michel. 2007. " The Political Investment of the Body", *The Body A Reader*, New York: Simultaneously Publishe.

Gardon, Sophie. 2007. "Photography in Inda", Asia's Colonial Photographies. [Online].Available at:<https://iias.asia/sites/default/fils/IIASNL44_1011.pdf>[Accessed 13 November 2016].

Levine, Philippa. 2007. *States of undress Nakedness and the Colonial Imagination*. [Online]. Available at: <https://www.ncbi.nlm.nih.gov/pubmed/19069002> [Accessed 13 November 2016].

W. Said, Edward. 2003. *Orientalism*. London: Published by the Penguin Group.